සැ. යු.-2010.05.07 දින පළ වූ අංක 1,653 දරන *ගැසට් පත්‍රයේ* I - III කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,654 - 2010 මැයි මස 14 වැනි සිකුරාදා - 2010.05.14**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | 1062 |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 1062 |
| පළාත් සභා විවිධ දැන්වීම් ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2010 මැයි මස 21 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2010 මැයි මස 07 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**ලක්ෂ්මන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# වෙනත් පත්කිරීම් ආදිය

**උතුරු මැද පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, ක්‍රීඩා හා යෞවන කටයුතු පිළිබඳ අමාත්‍යාංශය, පරිවාස නිලධාරීන් පත් කිරීම පිළිබඳ උතුරු මැද පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්වරයා ප්‍රකාශයට පත් කරනු ලබන නිවේදනය**

උතුරු මැද පළාතේ, පළාත් සභාවේ පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්වරයා වන, කොට්ටල බද්ද විදානලාගේ ධම්මික නාමල් මුතුගල වන මා 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එකතුකරන ලද 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සහ 1987 අංක 42 දරන පළාත් සභා පනත මගින්ද, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනත යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 1944 අංක 42 දරන වරදකරුවන් පරිවාස භාරයට පත් කිරීමේ ආඥාපනතේ 18(3) වගන්තිය ප්‍රකාරව පහත නම් සඳහන් අයවලුන් උතුරු මැද පළාතේ පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ පරිවාස නිලධාරීන් ලෙස ඔවුන්ගේ නම් ඉදිරියෙන් පෙන්වා ඇති දිනයන්හි සිට නැවත දැනුම් දීමක් කරන තුරු පත් කරන බවත්, ඔවුන් ඔවුන්ගේ නම් ඉදිරියෙන් දක්වා ඇති අධිකරණ කලාපයන්හි රාජකාරි කටයුතු සඳහා එදින සිටම කටයුතු කරන බවත් උතුම් වූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත්, ශ්‍රී ලංකාවාසී සියලු දෙනාටත් දැනුම් දෙමි.

| අනු. අංකය | නම | අධිකරණ කලාපය | වලංගු දිනය |
|---|---|---|---|
| 01. | අදි උදි සාමසාර රත්නමලල ඉරුගල් බණ්ඩාරලාගේ වන්නිනායක | අනුරාධපුර | 2005.09.01 |
| 02. | දෝන ශ්‍රියානි ද සිල්වා මහත්මිය | අනුරාධපුර | 2002.07.08 |
| 03. | කපුරුහාමිගේ කරුණා කීර්තිරත්න මහතා | තඹුත්තේගම | 2009.09.07 |
| 04. | සෙනෙවිරත්න මුදියන්සේලාගේ සිරිසේනගේ චන්ද්‍රා සෙනෙවිරත්න මෙනවිය | කැකිරාව | 2009.09.14 |
| 05. | අබේසිංහ මුදියන්සේලාගේ මුදියන්සේගේ අමරා ශ්‍රියාණි මහත්මිය | කැබිතිගොල්ලෑව | 2009.09.01 |
| 06. | උක්කු බණ්ඩාගේ තෙන්නකෝන් මහතා | පොළොන්නරුව | 2005.09.01 |
| 07. | දුනුමාලගේ මේනකා සුභාෂිණී ජයසේකර මහත්මිය | හිඟුරක්ගොඩ | 2002.10.16 |

කේ. බී. වී. ඩී. එන්. මුතුගල,
කොමසාරිස්.

පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව,
උතුරු මැද පළාත.

05-288

# පළාත් සභා නිවේදන

**1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු 255 වැනි අධිකාරය වන නගරසභා ආඥාපනතේ 154 වැනි වගන්තිය යටතේ පළ කරනු ලබන නිවේදනය**

255 වැනි අධිකාරය වන නගර සභා ආඥාපනතේ 157(14අ) අනුවගන්තිය මගින් පැවරී ඇති බලය අනුව එකී ආඥාපනතේ 153 වගන්තියෙහි විධිවිධාන අනුව මහරගම නගර සභාව විසින් සාදනු ලැබ, මෙහි පහත දැක්වෙන අතුරු ව්‍යවස්ථාව, 2007 ජූලි මස 31 වැනි දින පැවති මහරගම නගර සභා මහ සභා රැස්වීමේ අංක 08.1 දරන යෝජනාවෙන් සම්මතය ලබා ඇත. 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු ඉහත කී, නගර සභා ආඥාපනතේ 154 වැනි වගන්තිය ප්‍රකාර එකී අතුරු ව්‍යවස්ථාව බස්නාහිර පළාතේ පළාත් සභාවේ ප්‍රධාන

අමාත්‍ය හා මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය. ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, විදුලිබල හා බල ශක්ති, මිනිස්බල හා රැකි රක්ෂා සහ ආර්ථික ප්‍රවර්ධන පිළිබඳ අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මා විසින් අනුමත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ප්‍රසන්න රණතුංග,
බස්නාහිර පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය හා
මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන,
පළාත් පාලන හා පළාත් පරිපාලන, විදුලිබල හා බල ශක්ති,
මිනිස්බල හා රැකිරක්ෂා සහ ආර්ථික ප්‍රවර්ධන පිළිබඳ අමාත්‍ය.

කොළඹ 07, ශ්‍රාවස්ති මන්දිරයේ පිහිටි,
බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍යාංශයේ දී ය.

## අතුරු ව්‍යවස්ථාව - මහරගම නගර සභාව

### ආදාහනාගාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

01. මෙම අතුරු ව්‍යවස්ථාව මහරගම නගර සභාවේ ආදාහනාගාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හඳුන්වනු ලැබේ.

02. නගර සභාවට අයත් ආදාහනාගාරවල මෘත ශරීර ආදාහනය කිරීම ඒ සඳහා ගාස්තු නියම කිරීම හා අය කිරීම සහ ආදාහනාගාර පාලනය විධිමත් කිරීම සඳහා මෙම අතුරු ව්‍යවස්ථාව පනවනු ලැබේ.

03. නගර සභාවේ සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධරයකු විසින් නිකුත් කරන ලද අවසර පත්‍රයක් නොමැතිව සභාව සතු ආදාහනාගාරයක කිසිදු මෘත ශරීරයක් ආදාහනය නොකළ යුතුය.

04. තුන්වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් අවසර පත්‍රයක් ලබාගැනීමට අපේක්ෂා කරන (මෙහි මින්මතු ඉල්ලුම්කරු යැයි සඳහන් කරනු ලබන) තැනැත්තකු විසින් "අ" උපලේඛනයට සාරානුකූලව පිළියෙල කරන ලද ඉල්ලුම් පත්‍රයක් පහත සඳහන් ලියවිලි සමඟ සභාපතිවරයා හෝ ඔහුගේ බලයලත් නිලධාරියෙකු වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

(i) මියගිය තැනැත්තා පදිංචිව සිටි ග්‍රාමසේවා කොට්ඨාශයේ ග්‍රාමසේවා නිලධාරි විසින් නිකුත් කරන ලද සහතිකයක් හෝ මහරගම නගර සභාවේ සභාපති හෝ ගරු සභිකයින් විසින් නිකුත් කරන සහතිකයක් මේ සඳහා ප්‍රමාණවත් වේ.

(ii) මියගිය තැනැත්තාගේ මරණය සම්බන්ධයෙන් අපරාධ නඩු විධාන සංග්‍රහය යටතේ පරීක්ෂණයක් පවත්වන ලද්දේ නම්, පරීක්ෂණය පවත්වන ලද මරණ පරීක්ෂකවරයා හෝ මහේස්ත්‍රාත්වරයා විසින් උපත් හා මරණ ලියාපදිංචි කිරීමේ පනතේ 41(ඉ) වගන්තිය යටතේ මෘත ශරීරය ආදාහනය කිරීම සඳහා අවසර දෙමින් නිකුත් කරන ලද සහතිකය.

(iii) අජීවී උපතකින් බිහිකරන ලද මෘත ශරීරයක් නම්, උපත් හා මරණ ලියාපදිංචි කිරීමේ පනතේ (43) (1) වගන්තිය යටතේ නිකුත් කරන ලද සහතිකය.

05. සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රය සභාපතිවරයා වෙත භාරදෙනු ලැබීමෙන් පසු ලැබුණ අනුපිළිවෙල අනුව ලේඛනගත කළ යුතු වේ.

06. මෘත ශරීරය ආදාහනය කිරීම සඳහා භාරගනු ලබන්නේ නම්, ඒ සඳහා නියමිත ගාස්තුව අයකරගෙන අවසර පත්‍රය ඉල්ලුම්කරු වෙත නිකුත් කරනු ලැබිය යුතුවේ. ආදාහනාගාර භාරකරු වෙත මෘත ශරීරය භාරදිය යුතු වේලාව අවසර පත්‍රයේ සඳහන් කළ යුතුය.

07. මෘත ශරීරය ආදාහනය කිරීම සඳහා භාරගනු නොලබන්නේ නම්, ඒ බව එයට හේතු වූ කරුණු ද සමඟ ඉල්ලුම්කරුට ලිඛිතව දැන්විය යුතුය.

08. සෑම දිනකම පෙ. ව. 07.00 සිට ප. ව. 08.00 දක්වා කාලය ඇතුළත ආදාහනය කිරීම සඳහා මෘත ශරීර භාරගනු ලැබිය හැකිය.

09. ඉල්ලුම්කරු අවසර පත්‍රයේ සඳහන් කර ඇති වේලාවට හෝ එයට ප්‍රථම මෘත ශරීර ආදාහනාගාර භාරකරුවෙත බාරදිය යුතුය. ප්‍රමාදවී භාරදීම හේතුවෙන් ඇතිවන අපහසුතාවය හෝ අලාභ සම්බන්ධයෙන් නගර සභාව වගකීමට යටත් නොවිය යුතුය.

10. සෑම ආදාහනාගාරයකම ආදාහනය කරන ලද එක් එක් මෘත ශරීරය සම්බන්ධයෙන් ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය, මියගිය අයගේ නම හා ඔහු මියයාමට ප්‍රථම පදිංචිව සිටි ස්ථානයේ ලිපිනය හා ඉල්ලුම්කරු මියගිය තැනැත්තා සමඟ තිබූ සම්බන්ධතාවය, ආදාහනය සිදුකරන ලද දිනය හා වේලාව ආදී විස්තර ආදාහනාගාර භාරකරු විසින් ලේඛනගත කළ යුතු වේ.

11. මෘත ශරීරය ආදාහනය කර පැය 72 ක් ගතවීමට ප්‍රථම භස්මාවශේෂ ඉල්ලා සිටින ඉල්ලුම්කරු හෝ ඔහුගේ නියෝජිතයා භස්මාවශේෂ භාරගත යුතුවේ. මෘත ශරීරය ආදාහනය කිරීමෙන් පසු දින 7 ක් තුළ භස්මාවශේෂ ගෙනයන ලෙස ඉල්ලුම්කරුට ලිඛිතව දැන්වීමක් භාරදීමෙන් පසු එසේ බැහැර ගෙන නොගියහොත් එම භස්මාවශේෂ කවරාකාරයකින් හෝ බැහැර කිරීමට නිත්‍යානුකූල වන්නේ ය.

12. ආදාහනාගාර භාරකරුගේ හෝ සභාපතිවරයාගේ අවසරය නොමැතිව ආදාහනාගාර පරිශ්‍රයට ඇතුළුවීම වරදකි. එසේ වුව ද, මෘත ශරීරයක් ආදාහනය කිරීම සඳහා අවසර පත්‍ර ලාභියෙකු සමඟ පැමිණෙන තැනැත්තෙකුට හෝ තැනැත්තන්ට ඒ සඳහා අවසර දී ඇති ලෙස සලකනු ලැබිය යුතුය.

13. ආදාහනාගාර පරිශ්‍රය තුළ සාමය කඩවන ආකාරයට හැසිරීම හෝ ආදාහනාගාර පරිශ්‍රය තුළ පිහිටි සභාව සතු දේපලවලට අලාභහානි කිරීම හෝ ආදාහනාගාර භාරකරුගේ හෝ ඔහුගේ සහායකයින්ගේ හෝ රාජකාරි කටයුතුවලට බාධා කිරීම හෝ ආදාහනාගාර පරිශ්‍රය තුළ සැරසිලි කිරීම හෝ නොකළ යුතුය.

14. මෙම අතුරු ව්‍යවස්ථාවේ 12 සහ 13 වැනි අතුරු ව්‍යවස්ථා කඩකිරීම සම්බන්ධයෙන් යම් තැනැත්තෙකු නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් මගින් වරදකරු කරනු ලැබූ විට රු. 750 නොඉක්මවන දඩයකට ඔහු යටත් විය යුතුය.

15. (i) මෘත ශරීරය ආදාහනය කිරීමට සුදුසු තත්වයකින් ආදාහනාගාර නඩත්තු කිරීම සභාපතිවරයාගේ කර්තව්‍යය විය යුතුය.

(ii) ආදාහනාගාරයක් නඩත්තු කිරීම හෝ ප්‍රතිසංස්කරණය කිරීම සඳහා කිසියම් කාලයක් තුළ වසා තබනු ලබන්නේ නම්, ඒ පිළිබඳ නිවේදනය ආදාහනාගාරයේ ප්‍රකටව පෙනෙන ආකාරයට ප්‍රදර්ශනය කරවීම සභාපතිවරයාගේ කර්තව්‍යය විය යුතුය.

16. මෘත ශරීර ආදාහනය කිරීම සඳහා අයකරගත යුතු ගාස්තු නගර සභාවේ යෝජනා සම්මතයක් මගින් කලින් කලට පනවනු ලැබිය හැකිය. එසේ පනවනු ලබන ගාස්තු ප්‍රාදේශීය සභාව අවශ්‍ය යැයි සලකනු ලැබූ අවස්ථාවල දී සංශෝධනය කළ හැකිය. ඒ හැමවිටකම ඒ බව රජයේ *ගැසට් පත්‍රයේ* පළ කළ යුතුය.

17. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස,

"සභාව" යන්නෙන් මහරගම නගර සභාව ද, "සභාපති" යන්නෙන් මහරගම නගර සභාවේ සභාපති ද, "බලයලත් නිලධාරියා" යන්නෙන් සභාපතිවරයාගේ බලතල, කාර්යයන් හා කර්තව්‍යයන් ඉටුකිරීම සඳහා යම් ලිඛිත නීතියක් මගින් හෝ ඒ යටතේ බලය පවරනු ලැබ ඇති තැනැත්තෙකු ද,

"ආදාහනාගාර භාරකරු" යන්නෙන් සභාව සතු ආදාහනාගාරයක භාරකරු ලෙස කටයුතු කිරීම සඳහා පත්කර ඇති තැනැත්තෙකු ද,

"මෘත ශරීරය" යන්නෙන් මනුෂ්‍යයකුගේ මෘත ශරීරය හෝ මෘත ශරීරයකින් කොටසක් හෝ අජීවී උපතකින් බිහිකරන ලද සිරුරක් ද හෝ අදහස් වේ.

### "අ" උපලේඛනය

...................................................... ආදාහනාගාරයේ මෘත ශරීරය ආදාහනය කිරීම සඳහා ඉල්ලුම් පත්‍රය

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම :——————.
ලිපිනය :——————.
ජාතික හැඳුනුම්පත් අංකය :——————.
ග්‍රාම සේවා කොට්ඨාශය :——————.

2. මියගිය තැනැත්තාගේ නම :——————.
පදිංචිව සිටි ලිපිනය :——————.
ග්‍රාමසේවා කොට්ඨාශය :——————.
ජාතික හැඳුනුම්පත් අංකය :——————.

3. මියගිය තැනැත්තාට ඉල්ලුම්කරුගේ සම්බන්ධය :——————.

4. මරණ සහතිකයේ අංකය හා දිනය :——————.

5. මරණ ලියාපදිංචි කළ ලේකම්ගේ නම හා ලිපිනය :——————.

6. මරණය සිදුවූ ආකාරය :——————.

7. මරණය සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වන ලද්දේ නම් දිනය හා වේලාව :——————.

8. පරීක්ෂණ නිලධාරියාගේ නම හා තරාතිරම :——————.

9. පරීක්ෂණ නිලධාරියාගේ නිගමනය :——————.

10. මෘත ශරීරය ආදාහනය කිරීමට අවසර ලබාදෙන්නේ ද යන වග :——————.

11. ආදාහනය කිරීමට අවශ්‍ය දිනය හා වේලාව :——————.

ඉහත සඳහන් කර ඇති තොරතුරු සියල්ල නිවැරදි හා සත්‍ය බව සහතික කරමි. අදාළ සහතික අමුණා ඇත.

.........................................................
අයදුම්කරුගේ අත්සන හා දිනය.

***කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි :***

1. අවසර පත්‍රය නිකුත් කිරීම අනුමත කරමි. පහත සඳහන් හේතු මත අවසර පත්‍රයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කරමි.

..............................................................................
..............................................................................
..............................................................................

.................................................................
අත්සන
සභාපති/බලයලත් නිලධාරි
දිනය : ...................................................

***සභාපති/බලයලත් නිලධාරි :***

1. ලේඛනයේ සටහන් කරන ලදී.

.............................................................. දින අංක ................................................... දරන ලදුපතින් රු. ................................................. ක් අයකර ගන්නා ලදී.

2. අවසර පත්‍රය අත්සන සඳහා ඉදිරිපත් කරමි.

3. ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමට හේතු වූ කරුණු ඇතුළත් ලිපිය අත්සන සඳහා ඉදිරිපත් කරමි.

.............................................................
ලිපිකරුගේ අත්සන.
දිනය : ..........................................

05-211/1

---

**අතුරු ව්‍යවස්ථාව - මහරගම නගර සභාව**

මහරගම නගර සභාව සීමාව තුළ වාහන නවතා තැබීම සඳහා ස්ථාන ඇති කිරීම, පාලනය කිරීම සහ වාහනවලින් ගාස්තු අයකිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

(1) මෙම අතුරු ව්‍යවස්ථාව මහරගම නගර සභා බල ප්‍රදේශය ඇතුළත වාහන නතර කර තැබීම සඳහා ස්ථාන ඇති කිරීම සහ ඒ ස්ථානවල නවතා තැබීම වෙනුවෙන් ගාස්තු අයකිරීම සහ වාහන නවතා තැබීම පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හැඳින්වේ.

(2) මෙහි මින්මතු ‘සභාපතිවරයා’ වශයෙන් හඳුන්වනු ලබන මහරගම නගර සභාවේ සභාපතිවරයා විසින් බලප්‍රදේශය ඇතුලත වාහන නතර කර තැබීම හෝ නතර කර තැබීම තහනම් කරන හෝ සීමාකරන නැතහොත් පාලනය කරන යම් වීදියක, වීදියක කොටසක වාහන සඳහා වෙන්කර ඇති යම් වාහන නතර කිරීමේ ස්ථානය යනුවෙන් සඳහන් කරන දැන්වීමක් ඒ වීදියෙහි නැතහොත් වීදියෙහි කොටසක ප්‍රකට ස්ථානයක සිට පෙනෙන ආකාරයට ප්‍රදර්ශනය කරනු ලැබිය යුතුය. එසේ ප්‍රදර්ශනය වන ස්ථානයන්හි මිස වෙනත් තැනක වාහන නවතා තැබීම නොකළ යුතුය.

(3) 02 වැනි අතුරු ව්‍යවස්ථාවෙහි දක්වා ඇති දැන්වීමක් මගින් වාහන නතර කිරීම හෝ නතර කිරීම තහනම් කරනු ලැබ ඇති අවස්ථාවක වාහනයක රියදුරු විසින්,

*(අ)* කිසියම් නිලධාරියෙකු හෝ බලධාරියෙකු විසින් ඒ වීදියෙහි හෝ වීදියෙහි කොටසෙහි ඉදිකරනු ලැබ ඇති හෝ ප්‍රදර්ශනය කරනු ලැබ ඇති කිසියම් වාහන සංඥාවකට හෝ දැන්වීමකට අනුකූලව ක්‍රියාකිරීමේ ; *හෝ*

*(ආ)* ඒ වීදියෙහි හෝ වීදියෙහි කොටසෙහි ඒ අවස්ථාවේ පවත්නා කිසියම් වාහන ගමනාගමනයක පිළිවෙල නිසි පරිදි අනුගමනය කිරීමේ ; *හෝ*

(ඇ) කිසියම් තැනැත්තෙකුට එම වාහනයෙන් බැසීමට හෝ එම වාහනයට ගොඩවීමට ඉඩදීමේ ; හෝ

(ඈ) එම වාහනයකට බඩු පැටවීමේ හෝ ඒ වාහනයෙන් බඩු බෑමේ හෝ කාර්යය සඳහා අවශ්‍ය කාලයක් හැර එම වාහනය වීදියෙහි කොටසෙහි නතරකර තැබීම නොකළ යුතුය.

(4) සභාපතිවරයා විසින් මෙම අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරන ලද වලංගු අවසර පත්‍රයක් තමා සන්තයෙහි ඇත්නම් මිස කිසියම් තැනැත්තෙකු විසින් වාහන නතරකර තැබීම සඳහා වෙන්කර ඇති ස්ථානයක වාහනයක් නවතා තැබීම නොකළ යුතුය.

(5) 04 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරනු ලබන එක් එක් අවසර පත්‍රය සඳහා සභාව විසින් යෝජනා සම්මතයක් මගින් තීරණය කොට ගැසට් පත්‍රයෙහි පළකිරීමෙන් සංශෝධනය කිරීමට යටත්ව මෙහි "අ" "ආ" උපලේඛනයන්හි දක්වා ඇති පරිදි ගාස්තුවක් අයකරනු ලැබිය යුතුය.

**අ උපලේඛනය**

| | | පළමු පැය හෝ ඉන් ඉතිරි කොටසක් සඳහා ගාස්තුව රු. ශත | වැඩිවන සෑම අතිරේක පැයක් සඳහා ගාස්තුව රු. ශත |
|---|---|---|---|
| (අ) | පාපැදියක් සඳහා | 5 | 2 |
| (ආ) | යතුරු පැදියක් සඳහා | 10 | 5 |
| (ඇ) | මෝටර් කාරයකට | 20 | 10 |
| (ඈ) | බස් රථයක් හෝ ලොරියක් සඳහා | 100 | 20 |
| (ඉ) | වෑන් රථයක් හෝ වෙනත් මෝටර් වාහනයක් සඳහා | 30 | 10 |
| (ඊ) | ත්‍රීරෝද රථයක් සඳහා | 15 | 5 |

(6) පෞද්ගලික වාහන සඳහා ද මෙහි "ආ" උපලේඛනයෙහි සඳහන් මාසික හෝ වාර්ෂික බලපත්‍රයක් ලබාගත හැකිය.

**ආ. මහරගම නගර සභාවේ ලියාපදිංචි කුලී රථ සඳහා උපලේඛනය**

| | දිනකට රු. ශත |
|---|---|
| ත්‍රිරෝද රථ | 20 |
| ලොරි | 100 |
| බස් (පෞද්ගලික සහ ලංගම) | 100 |
| කුලී වෑන් රථ | 75 |

(7) මෙම අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරනු ලබන සෑම අවසර පත්‍රයක්ම එය නිකුත් කරනු ලැබූ විට මෝටර් වාහනයේ හැඳින්වීමේ අංකය සඳහන් විය යුතු අතර එය අවසර පත්‍රයෙහි සඳහන් කාලසීමාව සඳහා පමණක් වලංගු විය යුතුය.

(8) මෙම අතුරු ව්‍යවස්ථා යටතේ අවසර පත්‍රයක් ලබාගන්නා සෑම තැනැත්තෙක් විසින් ම එම අවසර පත්‍රය වාහනයෙන් පිටතට පෙනෙන පරිදි වාහනය තුළ ප්‍රකටව පෙනෙන ස්ථානයක ප්‍රදර්ශනය කළ යුතුය.

(9) පොලිස් නිලධාරියෙකු හෝ සභාපති විසින් බලය පවරා ඇති කවරෙකු හෝ ඉල්ලා සිටින අවස්ථාවක දී වාහන නතරකර තැබීමේ පොදු ස්ථානයක නතරකර ඇති යම් මෝටර් වාහනයක අයිතිකරුගෙන් නැතහොත් රියදුරුගෙන් එම මෝටර් වාහනය වෙනුවෙන් නිකුත් කර ඇති වාහන නවතා තැබීමේ අවසර පත්‍රය පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිනු ලැබූ කිනම් අවස්ථාවක වුවද, ඒ අවසර පත්‍රය එම අයිතිකරු හෝ රියදුරු විසින් ඉදිරිපත් කළ යුතුය.

(10) කිසියම් වාහන නතර කර තැබීමේ පොදු ස්ථානයක, කිසියම් නිශ්චිත පන්තියක හෝ වර්ගයක හෝ මෝටර් වාහන සඳහා වෙන්කරනු ලැබූ අවස්ථාවක කිසියම් තැනැත්තෙකු විසින් එම පන්තියට හෝ වර්ගයට අයත් නොවන මෝටර් වාහනයක් එහි නතර කර තැබීම නොකළ යුතුය.

(11) වාහන නතර කර තැබීමේ පොදු ස්ථානයකට ඇතුළුවන හෝ ඉන් පිටව යන හෝ වෙනත් මෝටර් වාහනයකට බාධාවන ආකාරයට කිසිම තැනැත්තෙක් විසින් වාහන නතර කර තැබීමේ පොදු ස්ථානයක මෝටර් වාහනයක් නතර කරනු නොලැබිය යුතුය.

(12) වාහන නතරකර තැබීම සඳහා වෙන්කර ඇති පොදු ස්ථානයක ඇතුළුවීම හා පිටවීම සඳහා වෙනම මාර්ග සලසා ඒ බව දැන්වීමක් හෝ සංඥා පුවරුවක් මගින් දක්වා ඇති අවස්ථාවක නියමිත මාර්ගයෙන් හැර කිසිම මෝටර් වාහනයක් එම ස්ථානයට ඇතුළුවීම හෝ පිටවීම නොකළ යුතුය.

(13) දම්වැල හෝ කුළුණු හෝ දම්වැල් කුළුණු යන දෙවර්ගයම සපයා ඇති පොදු නැවතුම්පළක නතර කරනු ලබන මෝටර් වාහන සියල්ලම ඒවා පැමිණි අනුපිළිවෙල අනුව එකිනෙක පිටුපසින් එකම පැත්තට මුහුණලා නතරකර තැබිය යුතුය.

(14) මෝටර් වාහන නතර කර තැබීමේ පොදු ස්ථානයක මෝටර් වාහනයක් නතර කර තිබියදී කිසිම තැනැත්තෙකු විසින් එම වාහනය සේදීම නොකළ යුතුය.

(15) කිසිම තැනැත්තෙකු විසින් වාහන නතරකර තැබීමේ පොදු ස්ථානයක වාහන ඉවත්කර ගැනීමේ කාර්යය සඳහා අලුත්වැඩියාවක් කිරීමක් අත්‍යාවශ්‍ය වන්නේ නම් මිස වාහන නතරකර තැබීමේ පොදු ස්ථානයක නතරකර තබා ඇති මෝටර් වාහනයක කිසිම ආකාරයක අලුත්වැඩියාවක් කරනු නොලැබිය යුතුය.

(16) එවැනි යම් අලුත්වැඩියාවක් සිදු කිරීමේ දී එහි අවස්ථානුකූල කරුණු ගැන සලකනවිට අනවශ්‍යවූ හෝ අසාධාරණ වූ හෝ කිසියම් ශබ්දයක් කරනු නොලැබිය යුතුය.

(17) පොදු නැවතුම්පොළක නතර කර තිබෙන මෝටර් වාහනයක කිසිම රියදුරෙකු විසින් :-

*(අ)* වාහනය නවතා ඇති ස්ථානය මාරු කිරීමේ හෝ එම නැවතුම්පොලෙන් ඉවත්ව යෑමේ හෝ කාර්යය සඳහා හැර තම එන්ජිම පණගැන්වීම ;

*(ආ)* අනතුරක් වැළැක්වීමේ හෝ වාහනයෙහි නැතහොත් එහි තුළ සිටින්නන්ගේ ආරක්ෂාව තහවුරු කර ගැනීමේ හෝ කාර්යය සඳහා මිස වාහනයේ සවිකර ඇති අනතුරු හැඟවීමේ උපකරණයන් නාද කිරීම නොකළ යුතුය.

(18) කිසිම තැනැත්තෙකු වාහන නතර කර තැබීමේ පොදු බිම්කඩ ඇතුලත, නොහික්මුණු ආකාරයට හැසිරීම හෝ කිසියම් කරදරයක් සිදුකිරීම හෝ නොකළ යුතුය.

(19) රජයේ දෙපාර්තමේන්තුවක් හෝ සංස්ථාවක් හෝ සංස්ථාගත නොවූ පුද්ගල මණ්ඩලයක් හෝ විසින් පහත දැක්වෙන මාසික ගාස්තුවක් සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියෙකු වෙත ගෙවනු ලැබීමෙන් අවස්ථාවෝචිත පරිදි එම දෙපාර්තමේන්තුවට හෝ පුද්ගල මණ්ඩලයට හෝ අයත් මෝටර් වාහන සඳහා මාසික අවසර පත්‍රයක් ලබාගනු ලැබිය හැකිය.

| | |
|---|---|
| *(අ)* බස් රථයක් හෝ ලොරියක් සඳහා | රු. 350/- |
| *(ආ)* මෝටර් රථයක් හෝ මෝටර් කෝච් රථයක් සඳහා | රු. 300/- |
| *(ඇ)* මෝටර් සයිකලයක් සඳහා | රු. 150/- |
| *(ඈ)* ත්‍රිරෝද රථයක් සඳහා | රු. 200/- |

(20) මෙම අතුරු ව්‍යවස්ථාව එක් එක් දින පෙ. ව. 06.00 සිට ප. ව. 06.00 දක්වා ක්‍රියාත්මක විය යුතුය. සභා යෝජනාවකින් අනුමත කරන ලද නිශ්චිත පුද්ගල පන්තියක්, නිශ්චිත ගාස්තු ද ගෙවීමෙන් නිදහස් කරනු ලැබිය හැකිය.

(21) මෙම අතුරු ව්‍යවස්ථාවලින් කිසිවක් කඩකරන යම් තැනැත්තෙකු වරදක් කරන අතර, එම තැනැත්තා නිසි බලය ඇති අධිකරණයක් ඉදිරියේ එම වරදට වරදකරු කරනු ලැබූ විට රු. 750/- කට නොවැඩි දඩයකට යටත්විය යුතු අතර, එම වරද දිගින් දිගටම කරගෙන යන විටක එසේ කරනු ලබන සෑම දිනකම රු. 250/- ක උපරිමයකට යටත් අතිරේක දඩයකට ද යටත් විය යුතු අතර, එම දඩමුදල් නගර සභාවේ පොදු අරමුදලකට බැරවිය යුතුය.

(22) (i) පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මෙම අතුරු ව්‍යවස්ථාවල 'සභාපතිවරයා' යන්නෙන් මහරගම නගර සභාවේ සභාපතිවරයා අදහස් වේ.

(ii) "පොලිස් නිලධාරියා" යන්නෙන් පොලිස් පරීක්ෂක නිලයට පහල නිලයක් දරන ශ්‍රී ලංකා පොලිස් සේවයේ පොලිස් නිලධාරියෙකු අදහස් වේ.

(iii) "රථවාහන පාලක" යන්නෙන් පොදු නතර කිරීමේ ස්ථානයක මෝටර් වාහන නතර කර තැබීම සඳහා සභාපතිවරයා වෙනුවෙන් අවසර පත්‍ර නිකුත් කිරීමට සභාපතිවරයා විසින් බලය පවරනු ලැබූ පුද්ගලයෙකු අදහස් වේ.

(iv) පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මෙම අතුරු ව්‍යවස්ථාවල මෝටර් රථය, මෝටර් කෝච් රථය, මෝටර් සයිකලය, මෝටර් වාහනය, ලොරිය සහ බස් රථය, ත්‍රිරෝද රථය යන්නට මෝටර් වාහන පනතේ ඇති අර්ථයම අදහස් වේ.

(v) "වාහනය" යන්නෙන් එය යන්ත්‍රානුසාරයෙන් හෝ අන්ලෙසකින් හෝ පදවනු ලැබුව ද, ගොඩබිමෙහි ගමනාගමන මාධ්‍යයක් වශයෙන් පාවිච්චි කරනු ලබන නැතහොත් පාවිච්චි කරනු ලැබිය හැකි කිසියම් කෘත්‍රිම උපක්‍රමයක් අදහස් වේ.

(v) "වාහන නවතා තැබීමේ පොදු ස්ථානය" යන්නෙන් මහරගම නගර සභාවේ යෝජනා සම්මුතියක් මගින් නම් කරනු ලබන ස්ථානයක් අදහස් වේ.

(vii) "නගර සභාව" යන්නෙන් මහරගම නගර සභාව අදහස් වේ.

05-211/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.